වේල්ස් කුමරි විද්‍යාලය - මොරටුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2022 නොවැම්බර්

වාර පරීක්ෂණය

12 ශ්‍රේණිය

ජීව විද්‍යාව - I	කාලය - පැය 1 ½ යි.

1). පෙන්ටෝස් වල බහු අවයවකයක් වන්නේ පහත සදහන් ඒවා අතුරින් කවරක්ද?
1. පිෂ්ටය 2. හෙමිසෙලියුලෝස් 3.සෙලියුලෝස් 4.ඉනියුලින් 5.කයිටින් (....4....)

2). ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයෙන් පමණක් දැකගත හැකි උප සෛලීය සංඝටකය වන්නේ,
1.න්‍යෂ්ටිය ය. 2.මයිටොකොන්ඩ්‍රියම ය. 3.හරිතලවය ය.
4.රයිබසෝම ය. 5.පිෂ්ඨකණිකාව ය. (....4....)

3) දිය ලිස්සන්නා ජලය මතු පිට ගමන් කරන්නේ ජලයේ ඇති කුමන ගුණයක් නිසාද?
1. අධික පෘෂ්ඨීක ආතතිය
2. ජල අණුවල සංසක්ති ආසක්ති බල
3. ධ්‍රැවීයතාවය
4. අධික විශිෂ්ඨතාපධාරිතාව
5. හිමායමනයේ දී ප්‍රසාරණය (....2....)

4) පොලිසැකරයිඩ පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වන්නේ,
1. ග්ලැක්ටියුරෝනික් අම්ලය බහුඅවයවීකරණයෙන් පෙක්ටීන් සෑදී ඇත.
2. කයිටීන් යනු නයිට්‍රජන් අඩංගු පොලිසැකරයිඩයකි.
3.ඇමයිලෝපෙක්ටීන් ශාඛනය වූ පොලිසැකරයිඩයකි.
4.ග්ලූකොසැමීන් හෙමිලියුලෝස්වල පදනම් ඒකකයයි.
5. ඉනියුලින් ශක්ති ප්‍රභවයක් ලෙස ෆ්‍රක්ටෝස් ගබඩා කරයි. (....4....)

5) සෛල සන්ධි පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1.මේවා මගින් යාබද සෛලවල සෛල ප්ලාස්ම සම්බන්ධ කරයි.
2.පේෂි සෛල අතර තද සන්ධි පවතී.
3.හිදැස් සන්ධිවල සිදුරු ආවරණය කරන විශේෂ පටල ප්‍රෝටීන ඇත.
4.ඩෙස්මසෝම මගින් විශිෂ්ඨ ප්‍රෝටීන ආධාරයෙන් යාබද සෛලවල ප්ලාස්ම පටල සම්බන්ධ කරයි.
5.ක්ෂුද්‍ර නාලිකා මගින් යාබද සෛලවල සෛල සැකිල්ල යාන්ත්‍රිකව සම්බන්ධ කිරීම නැංගුරම් සන්ධි මගින් සිදුකරයි (....4....)

22 A/L අපි [papers group]

CamScanner

6) C_4 ප්‍රභාසංස්ලේෂණය C_3 වෙනස් වන්නේ, C_4 ප්‍රභාසංස්ලේෂණයේ දී,

1. පත්‍ර මධ්‍ය සෛලවල හරිතලව තුළදී ආලෝක ප්‍රතික්‍රියාව මෙන්ම අඳුරු ප්‍රතික්‍රියාවද සිදුවීම.
2. ආලෝක ප්‍රතික්‍රියාවෙන් නිපදවනු ලැබූ ATP හා NADPH වල ශක්තියෙන් CO_2 ඔක්සිහරණය කිරීම.
3. රුබිස්කෝ එන්සයිමය අවකාශමය වශයෙන් වෙන්වීම හේතුවෙන් ප්‍රභාශ්වසනය වැළැක්වීම.
4. පත්‍ර මධ්‍ය සෛල හරිතලව සාපේක්ෂව කුඩා අතර ග්‍රානාවලින් පොහොසත් වීම.
5. ජලය භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව C_3 ශාකවලට වඩා අඩු වීම. (.....1.....)

7) ප්‍රභාපද්ධති පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමක්ද?

1. PSI සහ PSII දෙකම 680nm තරංග ආයාම කාර්යක්ෂමව අවශෝෂණය කරගනී.
2. එහි අඩංගු වන්නේ ක්ලෝරෆිල් සහ උපකාරක වර්ණක පමණි.
3. ඒවා පවතින්නේ හරිතප්‍රද වල තයිලකොයිඩ් සූස්තර මත සහ පංජරය තුළය.
4. ආලෝක ඵල ලබාගන්නා සංකීර්ණවල ප්‍රාථමික ඉලෙක්ට්‍රෝන ප්‍රතිග්‍රාහකය පවතී.
5. ඒවා ඉලෙක්ට්‍රෝන දායක මෙන්ම ප්‍රතිග්‍රාහක ලෙස ද ක්‍රියා කරයි. (.....5.....)

8) සෛල විභාජනයේදී සිදුවන ක්‍රියාවලි කිහිපයක් පහතින් දක්වා ඇත.

I. එක් වර්ණදේහයක ඇති වර්ණදේහාංශ යුගලය ප්‍රවේණිකව සර්වසම නොවේ.
II. සහෝදර වර්ණදේහාංශවල කයිනටකෝවල ධ්‍රැව දෙකෙන්ම විහිදෙන ක්ෂුද්‍ර නාලිකා සම්බන්ධ වීම.
III. තුරුව සකස් වී නොමැති අතර තර්කුව සෛල මධ්‍යයේ පිහිටයි.

ඉහත සෛලය හා විභාජනය පිළිබඳ නිවැරදි වන්නේ,

1. ශාක සෛලයකි. ඌනනය II විභාජනය පෙන්වයි.
2. ශාක සෛලයකි. ඌනනය I විභාජනය පෙන්වයි.
3. සත්ත්ව සෛලයකි. ඌනනය II යෝග කලාව පෙන්වයි.
4. සත්ත්ව සෛලයකි. අනුන විභාජනයේ යෝග කලාව පෙන්වයි.
5. ශාක සෛලයකි. අනුන විභාජනයේ යෝග කලාව පෙන්වයි. (.....1.....)

9) ප්‍රාක් කලාව I අවස්ථාව සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය වන්නේ,

1. උපාගමපට සංකීර්ණ සෑදීම.
2. සමජාත වර්ණදේහ සුළු වශයෙන් එකිනෙක ළං වීම.
3. වර්ණදේහ ඝන වීම ඇරඹීම.
4. න්‍යෂ්ටිකාව නොපෙනී යාම.
5. තර්කුව සෑදීම. (.....3.....)

10) ස්වායු ශ්වසන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වැරදි වන්නේ,

1. පයිරුවේට් ඔක්සිකරණය ක්‍රියාවලියේදී NADH අණු දෙකක් සෑදේ.
2. ක්‍රෙබ්ස් චක්‍රයේදී සිට්‍රික් අම්ලය මගින් ඔක්සලෝ ඇසිටික් අම්ලය පුනර්ජනනය වේ.
3. ග්ලයිකොලිසියේදී කාබන් දෙකක් සහිත පයිරුවේට් අණු දෙකක් සෑදේ.
4. ඉලෙක්ට්‍රෝන පරිවහන දාමයේදී ඔක්සිහරණය වූ සහ එන්සයිම ඔක්සිකරණය වේ.
5. අක්මා සෛලවල දී එක ග්ලූකෝස් අණුවකින් නිපදවන සම්පූර්ණ ATP ප්‍රමාණය 32කි. (.....3.....)

11) සෝපාද්‍රව අර්බුදයක් පිළිබඳව සත්‍ය නොවන්නේ,

1. ස්ථානාන්තරනය පෙන්වයි.
2. ආක්‍රමණශීලීව අවයව එකකට හෝ කිහිපයකට පහරදෙයි
3. ශල්‍යකර්මයක් මගින් සම්පූර්ණයෙන්ම ඉවත් කළ හැකිය.
4. ගුණනය වීමෙන් නව අර්බුදයක් සෑදිය හැකිය.
5. අවයව එකකට හෝ කිහිපයකට පහරදෙයි. (.....3.....)

22 A/L අපි [papers group]

CamScanner

12) එන්සයිම සම්බන්ධයෙන් පිළිගත හැකි ප්‍රකාශය වන්නේ,
1.සජීවී සෛල තුළදී පමණක් ක්‍රියාකාරී වේ.
2. උණුදිය උල්පත්වල සිටින බැක්ටීරියාවන්ගෙන් එන්සයිම ක්‍රියාකරන ප්‍රශස්ථ උෂ්ණත්වය 50 ^{0}C පමණ වේ.
3. ATP ඇලොස්ටරික් නිශේධකයක් ලෙස ක්‍රියා කරමින් අපචෘත්තිය වේගය වැඩි කරයි.
4.ඇලොස්ටරික් යාමක බොහෝ එන්සයිම උප ඒකක දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් සෑදී ඇත.
5.ට්‍රිප්සින් සඳහා ප්‍රශස්ථ ph අගය 2 වේ. (..........)

13) පහත කුමන සිදුවීම සීනෝසොයික යුගයේදී සිදුවූවක්ද?
1.ක්ෂීරපායීන්ගේ සම්භවය
2.ආදිතම මානවයා පූර්වජයා බිහිවීම.
3.සනාල ශාක විවිධාංගීකරණය
4.උභය ජීවීන් ප්‍රමුඛ වීම.
5.කරදිය ඇල්ගාවන් සුලබ වීම. (..........)

14) ප්‍රොටිස්ටා රාජධානිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1.ගණාවාසී හා බහු සෛලික විශේෂ බහුල ලෙස දක්නට ලැබේ.
2. සහජීවී ආකාර දැකිය නොහැකිය.
3.සියළුම ඒක සෛලික සතුව ජවිකාවක් දැකිය හැක.
4.*Gelidium, Saragassum,* Ulva සතුව සෛල බිත්ති දැකිය හැක.
5.රත්වන් දුඹුරු ඇල්ගී බහු සෛලික ජීවීන් වේ. (..........)

15) ඇනිමාලියා රාජධානියේ විවිධ ජීවීන් සතුව පවතින ව්‍යුහ සහ ඒවාට අදාළ කෘත්‍යයයන් නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.
1. අංශපාදිකා - භෝජනය හා සංචරණය
2. නාලපාද - සංචරණය හා බහිස්‍රාවය
3. දැඩිකෙඳි - සංචරණය හා ශ්වසනය
4. චූෂකර - සංචරණය හා අධිග්‍රහණය
5. මෙවුල - අභ්‍යන්තර සංසේචනය (..........)

16)සංවෘත සංසරණ පද්ධතියක ක්ෂීණ වී හෘදයක් රහිත වී ඇති සත්ත්ව වංශය වන්නේ,
1.නිඩාරියා
2.එකයිනොඩර්මේටා
3.ඇනෙලිඩා
4.නෙමටෝඩා
5.ප්ලැටිහෙල්මින්තස් (..........)

17)සංසෛලීය දිලිර සූත්‍රිකා දැකිය හැක්කේ,
1.*Mucor* හා *Penicillium*
2.*Aspergillus* හා *Chytridium*
3.*Chytridium* හා *Rhizopus*
4.*Agaricus* හා *Saccharomyces*
5.*Saccharomyces* හා *Penicillium* (..........)

18) *Hydra* පසඹිල්ලාගෙන් වෙන්කර හඳුනා ගැනීමට භාවිතා කළ හැකි *Hydra* ගේ ලක්ෂණයක් වන්නේ,
1.පංච අරීය සමමිතිය පෙන්වීම.
2. දේහ බිත්තියේ අසෛලීය මධ්‍ය ශ්ලේශයක් තිබීම.
3. නාල පාද තිබීම.
4.කරදියේ පමණක් ජීවත් වීම.
5. ලිංගික ප්‍රජනනය පමණක් දක්නට ලැබීම. (..........)

22 A/L අපි [papers group]

CamScanner

19) කෝඩේටා වංශයේ වර්ග දෙකක ජීවීන් පෙන්වන ලක්ෂණ ලැයිස්තු දෙකක් A හා B ලෙස පහත දැක්වේ.

A	B
• උත්ප්ලවකතාව පාලනයට වාතාශ තිබීම • අණ්ඩජතාව පෙන්වීම. • අස්ථිමය සැකිල්ලක් තිබීම. • වැඩි දෙනෙක් බාහිර සංසේචනයක් තිබීම	• අචලතාපී බව. • අභ්‍යන්තර සංසේචනය පෙන්වීම. • වර්ණදෘෂ්ටිය තිබීම. • දත් රහිත වීම.

A හා B වර්ග පිළිවෙළින්

1. Osteichthyes , Amphibia
2. Reptilia , Aves
3. Mammalia , Chondrichthyes
4. Osteichthyes , Aves
5. Aves , Reptilia

(............)

20) ශාක මුල්වල ප්‍රාථමික ව්‍යුහය පිළිබඳව අසත්‍ය වන්නේ,

1. බාහිකයේ ඇතුළතින්ම ඇති ස්ථරය අන්තශ්චර්මයයි.
2. මුලේ බාහිකයේ ප්‍රධාන වශයෙන් කාබෝහයිඩ්‍රේට සංචිත කරයි.
3. පරිචක්‍රය පාර්ශ්වික මුල් ඇති කිරීමට දායක වේ.
4. ඒක බීජ පත්‍රී මුලේ පරිචක්‍රයට විභාජනය වීමේ හැකියාව ඇත.
5. ද්වි බීජ පත්‍රී මූලක ශෛලමය තරුවක හැඩය ගනී.

(............)

21) ද්වි බීජ පත්‍රික මූලක ප්‍රාථමික ව්‍යුහය ඒකබීජ පත්‍රික ශාක මූලක ව්‍යුහයෙන් වෙන් කරගත හැක්කේ ද්විබීජ පත්‍රික මුලෙහි,

1. අන්තශ්චර්මය පරිචක්‍රයට ඇතුළතින් පිහිටීම නිසාය.
2. මධ්‍යයේ මෘදුස්තර සෛල හරයක් ඇති නිසාය.
3. සනාල කලාප වැඩි සංඛ්‍යාවක් ලබාගන්නා නිසාය.
4. පරිචක්‍රය විභාජන හැකියාව ලබාගන්නා නිසාය.
5. අන්තශ්චර්මය බාහික ඇපෝප්ලාස්ටය සනාල ඇපෝප්ලාස්ටයෙන් වෙන් කරන නිසාය.

(............)

22) පුටිකා විවෘත වීම දිරිමත් කිරීම සඳහා වඩාත් ඵලදායී වන්නේ කුමන වර්ණක ආලෝකයක්ද,

1. රතු
2. දුර - රක්ත
3. නිල්
4. රතුවලට පසුව දුර - රක්ත
5. දුර - රක්ත වලට පසුව නිල්

(............)

23) පරම්පරා ප්‍රත්‍යාවර්තනය පිළිබඳ සත්‍ය ප්‍රකාශය කුමක්ද?

1. විනාල ශාක සහ බීජ නොදරන සනාල ශාකවල ප්‍රමුඛ ජන්මාණු ශාකයක් ඇත.
2. බීජ නොදරන සහ බීජ සාදන සනාල ශාකවල ප්‍රමුඛ ජන්මාණු ශාකයක් ඇත.
3. බීජ නොදරන සහ බීජ සාදන සනාල ශාකවල ක්ෂීණ වූ ජන්මාණු ශාකයක් ඇත.
4. බීජ නොදරන සහ බීජ සාදන සනාල ශාකවල ස්වාධීන වූ ජන්මාණු ශාකයක් ඇත.
5. විනාල ශාක සහ බීජ නොදරන සනාල ශාකවල ප්‍රමුඛ බීජාණු ශාකයක් ඇත.

(............)

24) පිළිවෙලින් ඒකගුණ, ද්විගුණ සහ ද්විගුණ ව්‍යුහයක් දැක්වෙන්නේ කවර ප්‍රතිචාරයෙන්ද?

1. *Mucor* බීජාණුව, *Selaginella* බීජාණුධානිය, ආවෘතබීජක භ්‍රෑණපෝෂය
2. *Agaricus* බැසිඩිබීජාණුව, *Pogonatum* මූලාභය, *Pinus* මුල
3. *Pogonatum* බීජාණුශාකය, *Pogonatum* ශුක්‍රාණුව, *Agaricus* ද්විකාෂ්ටික සූත්‍රිකා
4. *Cycas* භ්‍රෑණපෝෂය, *Selaginella* සංකේතුව, *Nephrolepis* කාලුලය
5. *Selsginella* පුංජන්මාංගු ශාකය, *Nephrolepis* අණ්ඩාණුධානිය, Cycas මහා බීජාණු පත්‍රය

(............)

22 A/L අපි [papers group]

CS CamScanner

25) *Rheo (Tradescantia)* අපිචර්මීය සිවි විවිධ සාන්ද්‍රණවලින් යුත් සුක්‍රෝස් ද්‍රාවණ තුළ ගිල්වා තබනු ලැබීය.මෙම පරීක්ෂණය සම්බන්ධ සත්‍ය ප්‍රකාශය තෝරන්න.

1.යටි අපිචර්මීය සෛල අන්වීක්ෂය යටතේ නිරීක්ෂණය කරනු ලැබේ.
2.සුක්‍රෝස් සාන්ද්‍රණය වැඩි කරන විට වැඩි සෛල ප්‍රමාණයක් ශූන වේ.
3.ද්‍රාවණ සාන්ද්‍රණය සහ විශූනතා ප්‍රතිශතය අතර රේඛීය සම්බන්ධතාවයක් ඇත.
4.ශූන,විශූන සහ ආරම්භක විශූන සෛල අන්වීක්ෂයක් තුළින් නිරීක්ෂණය කළ හැක.
5.50% විශූනතාවය පෙන්වන ද්‍රාවණය මත පටකයේ ද්‍රාව්‍ය විභවය ගණනය කරනු ලැබේ. (...........)

26) අවුඩස් උපකරණය යොදා ගනිමින් ප්‍රභාසංශ්ලේෂණ ශීඝ්‍රතාව නිර්ණයේදී භාවිතා නොවන පියවරක් වන්නේ,

1.කැපී ගිය කෙළවර ඉහළට සිටින සේ ජලජ ශාකය තනුක $NaHCO_3$ ද්‍රාවණයක් සහිත නළයට ඇතුළු කිරීමය.
2.ජලජ ශාකයට d දුරක් ඈතින් ආලෝක ප්‍රභවය පවත්වා ගැනීමය.
3.අවුඩස් උපකරණය තුළට සිරින්ජයක් මගින් සබන් දියර ස්වල්පයක් එකතු කිරීම ය.
4.කේශික නළය තුළ වායු බුබුළ ගමන් කළ දුර මැනීමය.
5.විදුරු නළයේ නැම්ම තුළ එක් වූ ඔක්සිජන් ක්‍රමාංකික නළය වෙතට යොමු කරවා ගැනීමය. (...........)

27) පහත දැක්වෙන්නේ ශාක මූලද්‍රව්‍ය වල ඌනතා ලක්ෂණ කිහිපයකි.

a. පර්වවල දිග අඩුවීම.
b. ළපටි පත්‍රවල හරිතක්ෂය
c. පත්‍ර මායිම් කහ,දුඹුරු වීම.

ඉහත ලක්ෂණ පෙන්වන මූලද්‍රව්‍ය අනුපිළිවෙල වන්නේ,

1.S, Zn, Ca 2. K,Mg,N 3. B,S, Fe 4. Zn, S, K 5. Ni, Mn, Cu (...........)

28) බීජ ප්‍රරෝහණයට අදාළ පියවර කිහිපයක් පහත දැක්වේ.

a. ආහාර සංචිත සචල වීම.
b. කළලයේ සීඝ්‍ර වර්ධනය
c. ජලය අවශෝෂණය වීම.
d. එන්සයිම සක්‍රිය වීම.

මෙම පියවර අනුපිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

1.a, b,c,d 2. a, b,d,c 3. c, d,a,b 4. b,a,d,c 5. c, d,b,a (...........)

29) ශාක හෝමෝන පිළිබඳ පහත වගන්ති අතුරින් සත්‍ය වන්නේ කවරක්ද?

1.ඔක්සින හා ගිබරලින් යන දෙවර්ගයම කඳන් දික්වීම උත්තේජනය කරයි.
2.ඇබ්සිසික් අම්ලය මෙන් ම එතිලීන් ද වෘද්ධතාවය දිරි ගන්වයි.
3.ඔක්සින මගින් නියං කාලවලදී පත්‍ර ඡේදනය දිරි ගන්වයි.
4.ඔක්සින් හා සයිටෝකයින් අග්‍රස්ථ ප්‍රමුඛතාව දිරි ගන්වයි.
5.ගිබරලින් මගින් බීජ ප්‍රරෝහනය නිශේධනය කරයි. (...........)

30)අපිච්ඡද පටකවල ව්‍යුහික ලක්ෂණයක් වන්නේ,

1.අධික ලෙස වාහිනීමත් තිබීම ය.
2. සෑම විටම සෛල ස්තර කිහිපයකින් සමන්විත වීම ය.
3.විවිධ සෛල වර්ගවලින් සමන්විත වීමය.
4.අන්තර් සෛලීය අවකාශ බහුල වීම ය
5. ඇතැම් අපිච්ඡදවල නිදහස් පෘෂ්ඨය දක්වා විහිදී නොයන සෛල තිබීමය. (...........)

22 A/L අපි [papers group]

CS CamScanner

31)සම්බන්ධක පටක සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1.මේවා මගින් අවයව හා පටක ව්‍යුහමය ලෙස හා කෘත්‍යමය ලෙස සම්බන්ධ කරයි.

2.විශාල වූ බහිෂ් සෛලීය පූරකයක තන්තු හා සෛල පවතී.

3.රුධිර පටකය විශේෂිත සම්බන්ධක පටකයක් ලෙස සැලකේ.

4.පටකයේ ඇති ප්‍රත්‍යාස්ථ තන්තු මගින් ප්‍රත්‍යස්ථ බවත් ජාලාකාර තන්තු මගින් ශක්තිය හා සුනම්‍යතාවය හා ඇති කරයි.

5.පූරකයේ ඇති කුඹ සෛල මගින් හෙපැරින් හා හිස්ටැමීන් ස්‍රාවය කරයි. (..........)

32) සතුන්ගේ භෝජන යාන්ත්‍රණ හා නිදසුන් ජීවීන් නිවැරදි ව ගළපා ඇති වරණය වනුයේ,

1. තරල බුදීම - ඉහඳ පනුවා
2. උපස්තර බුදීම - මදුරුවා
3. තොග බුදීම - ගවයා
4. පෙරා බුදීම - කුඩිත්තා
5. තරල බුදීම - කාවාටියා (..........)

33) අග්න්‍යාංශයික යුෂයේ අඩංගු එන්සයිමයක් නොවන්නේ පහත සඳහන් කවරක්ද?

1.ට්‍රිප්සින් 2.කාබොක්සි පෙප්ටිඩේස් 3. ඇමයිනෝ පෙප්ටිඩේස්
4.කයිමෝ ට්‍රිප්සින් 5.නියුක්ලියේස් (..........)

34) සත්ත්ව ලෝකයේ අන්තරාල තරලය හා සංසරණ වන තරලය වෙන්වීමක් නොපෙන්වන සංසරණ පද්ධති දරන සත්ත්ව වංශය වන්නේ,

1.ආත්‍රොපෝඩා සහ මොලුස්කා ය.
2.ආත්‍රොප්‍රෝඩා සහ එකිනොඩර්මේටා ය.
3.නිඩාරියා සහ මොලුස්කා ය.
4.එකිනොඩර්මේටා සහ ඇනලීඩා ය.
5.ආත්‍රොපෝඩා සහ ඇනෙලීඩා ය. (..........)

35) අධ්‍යාතතිය ඇතිවීමට හේතු සාධකයක් නොවන්නේ,

1.මධුමේහය ය.
2.පුණු භාවිත ය.
3.දුම්බීම ය.
4.මානසිම ආතතිය ය.
5.ධමනි බිත්ති මත අඩු ඝනත්ව ලිපෝප්‍රෝටීන තැන්පත් වීම. (..........)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රතිචාර අතුරින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදි ය. කවර ප්‍රතිචාරය/ ප්‍රතිචාර නිවැරදි ද යන්න පළමුවෙන්ම විනිශ්චය කර ගන්න.ඉන්පසු නිවැරදි අංකය තෝරන්න.

A, B, C, යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම්.. 01
A, C,D යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම්.. 02
A හා B යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම්.. 03
C හා D යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම්.. 04
වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක්හෝ නිවැරදි නම්........................ 05

22 A/L අපි [papers group]

උපදෙස් සැකෙවින්				
1	2	3	4	5
A, B, C නිවැරදි ය	A, C, D නිවැරදි ය	A, B නිවැරදි ය	C,D නිවැරදි ය.	වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදි ය.

CS CamScanner

36) පහත සඳහන් ව්‍යුහික ලක්ෂණ - අපෘෂ්ඨවංශී සත්ත්ව වංශ සංකලන අතුරෙන් ගැළපෙන වගන්තිය/ වගන්ති තෝරන්න.

A. ශීර්ෂණය පිළිබඳ සළකුණු ඇති නමුත් පැහැදිලි නැත. - Platyhelminthes
B. ශාඛනය වූ අමාශවාහිනී කුහරයක් ඇත. - Cnidaria
C. දේහයේ පූර්ව කෙළවර සංවේදී පිරිකා ඇත Nematoda
D. සංචරණයට දැඩි කෙඳි ඇත - Annelida
E. මැල්පිගීය නාලිකා මගින් යූරික් අම්ලය බහිස්‍රාවය කරයි. - Platyhelminthes (..........)

37) සෛල තුළ සිදුවන රසායනික ප්‍රතික්‍රියා කිහිපයක් පහත දැක්වේ.එයින් සෛලීය ශ්වසනයේදී සිදුවන ප්‍රතික්‍රියා වන්නේ පහත කවරක්ද?

A. පයිරුවේට් + CoA + NAD^+ $\longrightarrow$ ඇසිටයිල් CoA + CO_2 , NADH
B. ග්ලූකෝස් + 2ADP + $2NAD^+$ $\longrightarrow$ පයිරුවේට් + 2ATP + 2NADH
C. RUBP + CO_2 $\longrightarrow$ 2x3PGA
D. ඔක්සලෝ ඇසිටේට් + ඇසිටයිල් CoA $\longrightarrow$ සිට්‍රේට් + CoA
E. පොස්පොඊනෝල් පයිරුවේට් + HCO_3 $\longrightarrow$ ඔක්ස්ලෝ ඇසිට්‍රේට් (..........)

38) කාෂ්ඨීය කඳක ද්විතියික පටක පිළිබඳව කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි ද?

A. සනාල කැම්බියමේ දිගැටි මවුලික සෛල සනාල කිරණ නිපදවයි.
B. පරිවර්මය ජලය සහ වායුවලට අපාරගම්‍ය වේ.
C. යම් කලකට පසු වල්ක කැම්බියම බිඳවැටී ඊට පිටතින් නව වල්ක කැම්බියමක් ඇතිවේ.
D. වසන්ත කාෂ්ඨයේ වාහිනිවල කුහර ග්‍රීෂ්මාන්ත කාෂ්ඨයේ වාහිනිවලට වඩා පළල් වේ.
E. මෘදු දැව වල ශෛලම වාහිනි නොමැත. (..........)

39) පාරිසරික ආතතිය සඳහා ශාක දක්වන ප්‍රතිචාරය පිළිබඳ නිවැරදි වනුයේ,

A. නියං ආතතිය - ඇබ්සිසික් අම්ලය නිදහස් වීම නිසා පූටිකා වැසීම.
B. ශීත ආතතිය - ප්ලාස්ම පටලයේ ලිපිඩ සංයුතිය වෙනස් කිරීම.
C. ශීත ආතතිය - සයිටසෝලයේ අඩංගු ද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම.
D. ලවණ ආතතිය - සයිටසොලය තුළ ජල විභවය වඩාත් සෘණ ලෙස පවත්වා ගැනීම.
E. ජෛව ආතතිය - වල්කය සහ ජේදස්තරය සෑදීම (..........)

40) සංසරණ පද්ධති සම්බන්ධව සත්‍ය ප්‍රකාශය /ප්‍රකාශ වන්නේ පහත කවරක්/කවර ඒවාද?

A. තණකොළ පෙත්තාගේ රුධිරය පෘෂ්ඨීයව හිස දෙසටත් උදරීයව අපර දෙසටත් ගමන්කරයි.
B. මුලින්ම සවෘත රුධිර වාහිණි පද්ධතියක් පරිණාමය වී ඇත්තේ නෙමටෝඩා වංශයේ ය.
C. ඒක සංසරණ පද්ධතියේ,හෘදයේ ඇත්තේ එක් කෝෂිකාවක් සහ එක් කර්ණිකාවක් පමණි.
D. බොහෝ උරගයන්ට ඇත්තේ කුටීර තුනකින් යුත් හෘදවේ.
E. පක්ෂීන්ගේ හෘදයේ කුටීර තුනකි (..........)

22 A/L අපි [papers group]

CamScanner

22 A/L අපි [papers group]

B කොටස - රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

1. a. හරිතලවයක සියුම් ව්‍යුහය විස්තර කරන්න.
   b. ප්‍රභාසංස්ලේෂණයේ දී හරිතලවයක පංජරය තුළ සිදුවන ක්‍රියාවලිය විස්තර කරන්න.

2. a. ද්විබීජ පත්‍රී ප්‍රාථමික මූලක හරස්කඩක නම් කරන ලද රේඛා සටහනක් අඳින්න.
   b. මූලකේෂ මගින් අවශෝෂණය කරගත් පාංශු ද්‍රාවණය, මූලේ ශෛලම දක්වා පරිවහනයවන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

3. මානව හෘදයේ ව්‍යුහය විස්තර කරන්න.

CamScanner

LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
GUIDE
PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
සිංහල
A9+
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440